www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව ශිෂ්‍ය විරෝධතා මැඩීමේ නීති යලි පනගන්වයි

**Sri Lankan government revives law to suppress student protests**

**කපිල ප්‍රනාන්දු විසිනි**

**2010 අප්‍රේල් 19**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (විප්‍රකොස) මගින් මෑත දී නිකුත් කරන ලද චක්‍රලේඛය, දිවයින පුරා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ දේශපාලන විරෝධතාවලට එරෙහිව එල්ල වූවකි. මෙම දැන්වීම පලවූයේ මහින්ද රාජපක්ෂ ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම් අනුව යමින් සමාජ වියදම් කප්පාදු කිරීමේ එහි කල්පමා වූ අය-වැය ඉදිරිපත් කිරීමට සූදානම් වන තත්වයක දී ය.

මෙම පියවරවල් සඳහා නිමිත්ත කරගෙන තිබෙන්නේ නවක සිසුන්ට විවිධ ක්‍රියාකාරකම්වලට බලකෙරෙන "නවක වදය" යි. සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ශිෂ්‍ය ව්‍යාපාරය වන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) ශිෂ්‍යයන් අතර සැලකිය යුතු විරුද්ධත්වයක් අවුලා ඇති නවක වදයට කුප්‍රකට ය.

ශිෂ්‍ය උද්ඝෝෂන සහ අනෙකුත් දේශපාලන ක්‍රියාකාරකම් මැඩලීම සඳහා උපයෝගී කරගත හැකි වඩා බලගතු පියවරයන් යුක්ති සහගත කිරීම සඳහා විප්‍රකොස සහ ආන්ඩුව මෙම පසුගාමී සහ සමහර අවස්ථාවලදී ප්‍රචන්ඩ වූ චාරිත්‍ර ගසාකනු ලැබ ඇත. විශ්වවිද්‍යාල පරිපාලනයන් මගින් පුලුල් ලෙස ක්‍රියාත්මක කර නැති 1998 දී සම්මත වූ "අධ්‍යාපන ආයතනවල නවකවදය හා වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත" මත මෙම නව චක්‍රලේඛය පදනම් වී ඇත.

ලිංගික අතවරයන්, බරපතල තුවාල සිදු කිරීම්, හානි ගෙන දෙන තර්ජනය කිරීම් චක්‍රලේඛය මගින් වැරදි ලෙස ලෙස නම් කර ඇත. ඒ අතරවාරයේ ම, එය "අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයෙකුට හෝ කාර්ය මන්ඩලයේ සාමාජිකයෙකුට හෝ නීතියට පටහැනි ලෙස බාධා කිරීමක්" සහ "අධ්‍යාපන ආයතනක පරිපාලනයට යටත්ව පවතින යම් පරිශ්‍රයක බලහත්කාරයෙන්" පදිංචි වීමක් සෙසු වැරදි ක්‍රියා ලෙස අවධාරනය කර ඇත. මැදිහත් වීම සඳහා විශ්වවිද්‍යාල අධිකාරියට පොලීසිය කැඳවීය හැකි බවට විප්‍රකොස අනතුරු ඇඟවීය.

මෙම "වැරදිවල" පවත්නා බලගතු ස්වභාවය වන්නේ - පිකට් කිරීම්, පෙලපාලි සහ විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ආක්‍රමනය කිරීම් - යනාදී දීර්ගකාලීනව පැවත අවුත්ව ඇති ශිෂ්‍යයන්ගේ උද්ඝෝෂන ක්‍රම තහනම් කිරීම සඳහා උපයෝගී කර ගත හැකි වීමයි. නීතිමාලාව මගින් පැහැදිලි වන්නේ දේශපාලන රැස්වීම් සහ දේශපාලන පත්‍රිකා බෙදාහැරීමත් මේ යටතට ඉලක්ක විය හැකි බවයි. විශ්ව විද්‍යාල බලධාරීන් කල යුතු එකම දෙය වන්නේ ශිෂ්‍යයන් අදාල ක්‍රියාකාරකම්වලට සහභාගි කරවා ගැනීමේදී ඔවුන් මත බලහත්කාරය යොදාගෙන ඇතැයි කීම පමනි.

දඬුවම් ඉතා කෲර ය. චක්‍රලේඛය මෙසේ අවධාරනය කරයිඃ "ඉහත 1998 පනත යටතේ සඳහන් කරනු ලැබ ඇති බොහෝ වැරදි සඳහා වසර දහයක් දක්වා සිරදඬුවම් දීම සඳහා නීතියෙන් අවසර ඇති අතර සහ ඇප දීම සිදු කල නොහැක. එලෙස ම ඉහත පනතේ නියමන්ට අනුව යම් ශිෂ්‍යයෙකු වරදකරු වුවහොත්, ආයතනයෙන් නෙරපීමටත් යම් දේපලකට සහ තුවාල සිදු වු තැනැත්තෙකුට වන්දි ගෙවීමටත් නීතියෙන් බැඳී සිටීමට සිදුවනු ඇත.

විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් පිටත දී හෝ ඇතුලත දී කවරාකාරයේ හෝ නවකවදයකට සහ ප්‍රචන්ඩ ක්‍රියාවක නොයෙදෙන බවට වු ප්‍රකාශයකට ශිෂ්‍යයන් අත්සන් තැබිය යුතු වන අතර එය දෙමාපියන් හෝ භාරකරු විසින් ද සහතික කල යුතු ය. මාර්තු 24 දා උසස් අධ්‍යාපන ඇමති විශ්වා වර්නපාල ඩේලි මිරර් පුවත් පතට ප්‍රකාශ කලේ එම ප්‍රකාශයට අත්සන් නො කරන කිසිදු ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාලයට බඳවා නොගන්නා බවයි. නව මාර්ගෝපදේශ ක්‍රියාත්මක වනවාත් සමගම නවක වදය සහ ප්‍රචන්ඩ ක්‍රියා අවසන් වන බවට වර්නපාල පුරසාරම් දෙඩී ය. නව අධ්‍යන වර්ෂය ජුනි මාසයේ ආරම්භ වනු ඇත.

ආන්ඩුවට සහ විප්‍රකොස ට මැදිහත් වීම සඳහා කොන්දේසි සකසා දීම සම්බන්ධයෙන් ජවිපෙ සහයෝගය දෙන අවිශිබම ය සෘජුව ම වගකිව යුතු ය. වඩාත් පසුගාමී ශිෂ්‍යයන් අතරින් ආකර්ෂනය කර ගැනීමේ මාර්ගයක් ලෙස අවිශිබම නවකවදය භාවිතා කොට තිබේ. සියලු ශිෂ්‍යයන් නියෝජනය කරනවා ය යන එහි කියාපෑම ඕනෑ ම දේශපාලන විරුද්ධවාදියෙකුට එරෙහිව මැරකම් කිරීම මතින් යොදවා ඇත. සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි)හි සමාජිකයන්ගේ විශ්වවිද්‍යාල තුල මැදිහත්වීම් කිහිපයකටම අවිශිබම යේ නායකයින් අවහිර කිරීම් සිදු කර ඇත.

රාජපක්ෂ යටතේ, අධ්‍යාපන වියදම් කප්පාදුවට, පිරිහෙමින් තිබෙන අධ්‍යයන, නවාතැන් පහසුකම් සහ විශ්වවිද්‍යාල පුද්ගලීකරනයට එරෙහිව අවිශිබම ය උද්සෝෂන පවත්වා තිබේ. කෙසේවෙතත් මෙම විරෝධතා පවත්නා විරුද්ධත්වය වාෂ්ප කර දැමීම සහ සහන ඉල්ලා ආන්ඩුවට පීඩනය යෙදීමේ හුදකලා සිද්ධීන් බවට පත්ව ඇත. ජවිපෙ මෙන්ම අවිශිබම ද රාජපක්ෂ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව නැවත ආරම්භ කරන ලද යුද්ධයට සහයෝගය දුන් අතර ශිෂ්‍යයන්ට අවධාරනය කලේ යුද ප්‍රයත්නය අනිත් සියලු දේට ඉදිරියෙන් තැබිය යුතු බවයි.

ශිෂ්‍යයන් අතර එහි අධිකාරිය බාදනය වන තත්වයක් තුල අවිශිබම ය වැඩි වැඩියෙන් තර්ජන සහ ප්‍රචන්ඩ ක්‍රියාවල නිරත වීමට යොමුවිය. එවැනි විධික්‍රම ආන්ඩුවට සහ විශ්වවිද්‍යාල අධිකාරීන්ට විශ්වවිද්‍යාල තුල වඩවඩාත් මර්දනකාරී පිලිවෙත් ක්‍රියාවට නැගීමට ඉඩ සලසා දුන්නේය.

2009 පෙබරවාරියේ දී, කැලනිය විශ්වවිද්‍යාලයේ අවිශිබම ය සහ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ශිෂ්‍ය කන්ඩායමක් අතර වූ ගැටුමක් පොලීසිය සහ විශ්වවිද්‍යාල බලධාරීන් මහා පරිමාන පොලිස් මෙහෙයුමක් යුක්ති සහගත කිරීමට යොදා ගත්තේ ය. පොලීසිය විශ්වවිද්‍යාලය තුලට කඩා වැද ශිෂ්‍යයන්ට, දේශකයන්ට සහ අනධ්‍යයන කාර්ය මන්ඩල සමාජිකයන්ට ඉවක් බවක් නොමැතිව ප්‍රහාර දියත් කලේ ය. දේශකයන් දෙදෙනෙකු සහ ශිෂ්‍යයන් 13 දෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී. කාන්තා ශිෂ්‍යාවන් තමන්ගේ නිර්දෝශිභාවය ගැන අයැද සිටියදීත් පිරිමි පොලිස් නිලධාරීන් ඔවුන්ගේ කොන්ඩෙන් ඇදගෙන ගොස් පොලිස් බස්රථයට ඇද දමා ගන්නා ආකාරය රූපවාහිනි ආවරනය මගින් පෙන්නුම් කරන ලදී.

සිද්ධියට පසුව දක්ෂිනාංශික අයිලන්ඩ් පුවත්පතේ කතුවැකියක් පොලිස් ක්‍රියාව ඉහලින් වගවර්නනා කලේ ය. එල්ටීටීඊයට එරෙහි අවසන් අදියරේ මෙහෙයුම් වල දී මිලිටරිය ගෙන ගිය මිලේච්ඡත්වය පෙන්වා දෙමින්, "විවිධ වර්ගයේ ත්‍රස්තවාදයන්ගෙන් උසස් අධ්‍යාපන ආයතන පරිපූර්නව නිදහස් කර ගැනීමට ඉදිරියට යන ලෙස සුදුසු යයි හැඟෙනා කවර හෝ විධික්‍රමයක් යොදා ගන්නා ලෙස පොලීසියෙන් ඉල්ලා සිටියේ ය." ආන්ඩුවට කැඳවුම් කර සිටි කතුවැකිය "දරුනු වුවත් එවැනි අත්‍යවශ්‍ය පියවර සඳහා පවත්නා නීති ප්‍රමානවත් නොවේ නම් නව නීති සකස් කල යුතු බව" කතුවැකිය ප්‍රකාශ කලේ ය.

යහපත් අධ්‍යාපන පහසුකම් වෙනුවෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඉදිරිපිට දී උද්සෝෂනයක නිරත වී සිටිය දී අවිශිබම යේ කැඳවුම්කරු උදුල් ප්‍රේමරත්න සහ ආයුර්වේද විශ්වවිද්‍යාලයේ තවත් සිසුන් 14 දෙනෙක් පොලීසිය විසින් පසුගිය සැප්තැම්බර් මාසයේ දී අත්අඩංගුවට ගනු ලැබූහ. මහජන දේපලවලට හානි සිදු කිරීම ඔවුන්ට එරෙහි චෝදනා වූ අතර පොලීසිය සිදු වූ හානියේ තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කරන තෙක් සති ගනනක් ඔවුන්ව අත්අඩංගුවේ රඳවා තැබී ය. ඔක්තෝබර් 07 වනදා ශිෂ්‍යයන් නිදහස් කිරීමට උසාවිය නියෝග කල නමුත් ප්‍රේමරත්නව මාසය අග වන තෙක් ම රඳවා තබා ගත්තේ ය.

විප්‍රකොස 1998 නවක වද පනත දැන් යලි ක්‍රියාත්මක කිරීම අහම්බයක් නොවේ. මේ මාසයේ පාර්ලිමේන්තු මැතිවරනය ජයග්‍රහනය කිරීමෙන් පසුව රාජපක්ෂ ආන්ඩුව තෘතීයක අධ්‍යාපනය ද ඇතුලු අත්‍යවශ්‍ය මහජන සේවාවන් කප්පාදු කිරීමේ අයවැයක් සූදානම් කරමින් සිටී. සිවිල් යුද්ධය අතරතුර දී ගොඩගැසුනු දැවැන්ත නය අඩු කිරීමේ මාර්ගයක් ලෙස ජාමූඅ අය-වැය හිඟය ලබන අවුරුද්ද තුල දී අඩකින් අඩු කිරීමට ඉල්ලා සිටී. පසුගිය නොවැම්බර් වලට යෙදී තිබූ අයවැය රාජපක්ෂ ප්‍රමාද කලේ මැතිවරනය නිමාවන තෙක් ය.

නිල දත්තයන්ට අනුව, අධ්‍යාපනය සඳහා රාජ්‍ය ආයෝජන 2008 දී රුපියල් බිලියන 23 සිට 2009 දී රුපියල් බිලියන 17 දක්වා දැනටමත් කපා හැර ඇත. එම කාලයේ දීම, සෞඛ්‍ය අංශයේ ආයෝජන රුපියල් බිලියන 19 සිට 13 දක්වා අඩු කලේ ය. ඒ අතරවාරයේ දී පසුගිය අවුරුදු 5 ඇතුලත ආන්ඩුව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුද්ගලික අංශයට විශේෂයෙන්ම විදේශ ආයෝජකයන් සඳහා විවෘත කරනු ලැබ ඇත.

1998 පනත යලි ස්ථාපිත කිරීම විශ්වවිද්‍යාල තුල නවක වදය නැවැත්වීම එල්ල කර ගත්තක් නොවේ. ආන්ඩු සහ විශ්වවිද්‍යාල බලධාරීන් එවැනි භාවිතයන් සහ අවිශිබම වසර ගනනාවක් ඉවසා සිටියේ එම සංවිධානය ශිෂ්‍යයන්ගේ නොසන්සුන්තාවය රඳවා තබා ගැනීමට ප්‍රයෝජනවත් දායකත්වයක් ලබා දෙන බව හොඳින් දන්නා නිසා ය. රාජපක්ෂ ආන්ඩුව බිය වී

ඇත්තේ ජීවන තත්වයන් කඩාපාත් වීම සම්බන්ධව කම්කරුවන්ගේ සහ ගම්බද දුගීන්ගේ පුලුල්ව පැතිරුන නො සන්සුන්තාවය සමග නව වටයක ශිෂ්‍යයන්ගේ පෙරලිකාරීත්වය ඒකාබද්ධ වේ ය යන්න පිලිබඳව යි.

මෙම ප්‍රහාරයන් අභිමුඛ කිරීමට නම් ශිෂ්‍යයන් සිංහල ස්වෝත්තමවාදය මත පදනම් වූ අවිශ්බමයේ බංකොලොත් ඉදිරිදර්ශනය ප්‍රතික්ෂේප කල යුතු අතර අව්‍යාජ සමාජවාදී විකල්පයක් දිසාවට හැරී ගත යුතු ය. ශිෂ්‍යන්ට තමන්ගේ මූලික අයිතීන් ආරක්ෂා කර ගත හැක්කේ කම්කරු පන්තිය දිසාවට හැරීගත් සහ ධනවත් අතලොස්සකගේ ලාභ අවශ්‍යතා සඳහා නොව වැඩකරන ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන ආකාරයට සමාජය ප්‍රතිනිර්මානය කරන සහ ධනවාදය පෙරලා දැමීම ඉලක්ක කර ගත් ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා යොමු වී ගැනීමෙන් පමනි. සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ශිෂ්‍ය ව්‍යාපාරය වන සසජාශි සටන් වදින ක්‍රියාමාර්ගය එයයි.

© www.wsws.org